IslamHouse.com

37 අස් සාෆ්ෆාත්

(පෙළගැසී සිටින්නන්)

ආයත් 1-182 දක්වා.

අල් කුර්ආනය

< Sinhala>

මාහිර් රම්ඨීන්

පරිවර්තක

ඉස්ලාම් හවුස් වෙබ් අඩවියේ සංස්කරණ මණ්ඩලය

විචාරය කිරීම

ترجمة معاني القرآن الكريم

سورة الصافّات- 37

< السنهالية >

القرآن الكريم

ترجمة:

ماهر رمدين

مراجعة:

محمد آساد ونخبة العلماء الكرام

المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
هاتف: ٩٦٦١١٤٤٥٤٩٠٠+ فاكس: ٩٦٦١١٤٩٧٠١٢٦+ ص ب: ٢٩٤٦٥ الرياض: ١١٤٥٧
ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126
OFFICERABWAH

37 සූරත් අස්-සාෆ්ෆාත් (පෙළගැසී සිටින්නෝ)

මක්කාහ්වෙහි දී හෙළිදරව් කෙරුණකි.

ආයාත් (වැකි) 182 කි.

بِسْمِ اللهِ الرَّحْمنِ الرَّحِيْمِ

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

1-10 අල්ලාහ්ගේ ඒකීයභාවය, විශ්වයේ විසිර පවතින ඔහුගේ බලය සහ ෂය්තානුවන්ගෙන් අහස ආරක්ෂා කොට තිබීම.

وَالصَّافَّاتِ صَفًّا {1}

පෙළින් පෙළට පෙළ ගැසී සිටින්නන්(මලක්වරු)මත දිවුරමින්.

فَالزَّاجِرَاتِ زَجْرًا {2}

තවද පසුපසින් මෙහෙයවා යන්නන් (මලක්වරු) මත දිවුරමින්.

فَالتَّالِيَاتِ ذِكْرًا {3}

තවද මෙනෙහි කිරීම පාරායනය කරන්නන් මත දිවුරමින්.

إِنَّ إِلَٰهَكُمْ لَوَاحِدٌ {4}

නියත වශයෙන්ම නුඹලාගේ දෙවියා එකමය.

رَبُّ السَّمَاوَاتِ وَالْأَرْضِ وَمَا بَيْنَهُمَا وَرَبُّ الْمَشَارِقِ {5}

අහස් හා මහොපොළොවෙහි ද ඒ දෙක අතර ඇති දෑහි ද හිමිපාණන්ය. තවද නැගෙනහිරවල්හි ද හිමිපාණන්ය.

إِنَّا زَيَّنَّا السَّمَاءَ الدُّنْيَا بِزِينَةٍ الْكَوَاكِبِ {6}

නියත වශයෙන්ම සමීපව පිහිටි අහස අපි ග්‍රහ වස්තු මගින් අලංකාරවත් කළෙමු.

وَحِفْظًا مِنْ كُلِّ شَيْطَانٍ مَارِدٍ {7}

තවද සීමාව ඉක්මවා ගිය සෑම ෂෙයිතානුවකුගෙන්ම ආරක්ෂාවක් වශයෙනි.

لَا يَسَّمَّعُونَ إِلَى الْمَلَإِ الْأَعْلَىٰ وَيُقْذَفُونَ مِنْ كُلِّ جَانِبٍ {8}

උසස් වූ පිරිස (මලක්වරු) වෙත ඔවුන් සවන් දිය නොහැකිය. තවද ඔවුහු සෑම පැත්තකින්ම පහර දෙනු ලබති.

دُحُورًا ۖ وَلَهُمْ عَذَابٌ وَاصِبٌ {9}

(එය) පලවා හැරීමක් වශයෙනි. තවද ඔවුනට නිරන්තර දඬුවමක් ඇත.

إِلَّا مَنْ خَطِفَ الْخَطْفَةَ فَأَتْبَعَهُ شِهَابٌ ثَاقِبٌ {10}

(රහස් කතා) පැහැර ගෙන සවන් දෙන්නා හැර. එවිට සිදුරු කරන උල්කාවන් ඔහු ලුහුබඳියි.

11-39 නැවත නැගිටුවීමක් සිදු වේ.

فَاسْتَفْتِهِمْ أَهُمْ أَشَدُّ خَلْقًا أَمْ مَنْ خَلَقْنَا ۚ إِنَّا خَلَقْنَاهُمْ مِنْ طِينٍ لَازِبٍ {11}

“මැවීමෙන් වඩාත් බලවත් වන්නේ ඔවුන් ද එසේ නැතහොත් අපි මවා ඇති දෑ දැ” යි ඔවුන්ගෙන් ඔබ විමසනු. නියත වශයෙන් අපි ඔවුන් ඇලෙන සුළු මැටියෙන් මැව්වෙමු.

بَلْ عَجِبْتَ وَيَسْخَرُونَ {12}

නමුත් ඔබ පුදුම වූයෙහිය. ඔවුහු (ඒ ගැන) සමච්චල් කරති.

وَإِذَا ذُكِّرُوا لَا يَذْكُرُونَ {13}

තවද ඔවුනට උපදෙස් කරනු ලබන විට ඔවුහු උපදෙස් නොලබති.

وَإِذَا رَأَوْا آيَةً يَسْتَسْخِرُونَ {14}

තවද ඔවුහු සංඥාවක් දුටු විට සමච්චල් කරති.

وَقَالُوا إِنْ هَٰذَا إِلَّا سِحْرٌ مُبِينٌ {15}

තවද ඔවුහු මෙසේ පවසා සිටියහ. “මෙය පැහැදිලි හූනියමක් මිස නැත”

أَإِذَا مِتْنَا وَكُنَّا تُرَابًا وَعِظَامًا أَإِنَّا لَمَبْعُوثُونَ {16}

“අප මිය ගොස් පස් හා අස්ථි බවට පත් වූ විට නියත වශයෙන්ම අපි නැවත නැගිටුවනු ලබන්නෝ වෙමු ද?” යි ඔවුහු පවසති.

“අපගේ මුල් මුතුන්මිත්තන් ද (නැවත නැගිටුවනු ලබන්නෝ ද)”	أَوَآبَاؤُنَا الْأَوَّلُونَ {17}
“එසේය. තවද නුඹලා (අල්ලාහ් ඉදිරියේ) පහත් වූවන් යැ”යි ඔබ පවසනු.	قُلْ نَعَمْ وَأَنْتُمْ دَاخِرُونَ {18}
නියත වශයෙන්ම එය එක් හඬකි. එවිට ඔවුහු එය දකිති.	فَإِنَّمَا هِيَ زَجْرَةٌ وَاحِدَةٌ فَإِذَا هُمْ يَنْظُرُونَ {19}
තවද “අහෝ! අපගේ විනාශය. මෙය විනිශ්චය දිනය වේ” යැයි ඔවුහු පවසති.	وَقَالُوا يَا وَيْلَنَا هَٰذَا يَوْمُ الدِّينِ {20}
“නුඹලා කවර දෙයක බොරුකරමින් සිටියේ ද එම විනිශ්චය දිනය මෙය වේ” (යැයි කියනු ලැබේ.)	هَٰذَا يَوْمُ الْفَصْلِ الَّذِي كُنْتُمْ بِهِ تُكَذِّبُونَ {21}
අපරාධ කළවුන් හා ඔවුන්ගේ ජොඩු ද අල්ලාහ්ගෙන් තොර ව ඔවුන් ගැතිකම් කරමින් සිටි දෑ ද නුඹලා එක්රැස් කරනු. තවද නිරයේ මාවත වෙත නුඹලා ඔවුනට මග පෙන්වනු.	احْشُرُوا الَّذِينَ ظَلَمُوا وَأَزْوَاجَهُمْ وَمَا كَانُوا يَعْبُدُونَ {22} مِنْ دُونِ اللَّهِ فَاهْدُوهُمْ إِلَىٰ صِرَاطِ الْجَحِيمِ {23}
තවද නුඹලා ඔවුන් නවතා තබනු. නියත වශයෙන්ම ඔවුන් විනිශ්චය කරනු ලබන්නෝය.	وَقِفُوهُمْ ۖ إِنَّهُمْ مَسْئُولُونَ {24}
නුඹලාට කුමක්වීද? නුඹලා එකිනෙකා උදව් කර නොගන්නෙහුය.	مَا لَكُمْ لَا تَنَاصَرُونَ {25}
එසේ නොව ඔවුහු අද දින යටත් වූවෝය.	بَلْ هُمُ الْيَوْمَ مُسْتَسْلِمُونَ {26}

ඔවුන්ගෙන් ඇතැමෙකු ඇතැමෙකු වෙත මුහුණ ලා ඔවුහු එකිනෙකා විමසා ගනිති.	وَأَقْبَلَ بَعْضُهُمْ عَلَىٰ بَعْضٍ يَتَسَاءَلُونَ {27}
නියත වශයෙන්ම නුඹලා දකුණු දෙසින් අප වෙත පැමිණෙමින් සිටියෙහුය යැයි ඔවුහු පවසා සිටියහ.	قَالُوا إِنَّكُمْ كُنْتُمْ تَأْتُونَنَا عَنِ الْيَمِينِ {28}
“එසේ නොව නුඹලා දෙවියන් විශ්වාස කරන්නන් නොවූයෙහු” යැයි ඔවුහු පවසා සිටියහ.	قَالُوا بَلْ لَمْ تَكُونُوا مُؤْمِنِينَ {29}
නුඹලා මත කිසිදු බලයක් (යෙදවීමට) අපට නොවීය. නමුත් නුඹලා සීමාව ඉක්මවා ගිය පිරිසක් වූහ.	وَمَا كَانَ لَنَا عَلَيْكُمْ مِنْ سُلْطَانٍ ۖ بَلْ كُنْتُمْ قَوْمًا طَاغِينَ {30}
එහෙයින් අපට එරෙහි ව අපගේ පරමාධිපතිගේ ප්‍රකාශය නියම වී ඇත. නියත වශයෙන්ම අපි (එය) රස විඳින්නෝ වෙමු.	فَحَقَّ عَلَيْنَا قَوْلُ رَبِّنَا ۖ إِنَّا لَذَائِقُونَ {31}
එහෙයින් අපි නුඹලා නොමග හැරියෙමු. නියත වශයෙන්ම අප ද නොමග ගියවුන් වූයෙමු.	فَأَغْوَيْنَاكُمْ إِنَّا كُنَّا غَاوِينَ {32}
එහෙයින් නියත වශයෙන්ම ඔවුහු එදින දඬුවමෙහි හවුල්කරුවෝ වෙති.	فَإِنَّهُمْ يَوْمَئِذٍ فِي الْعَذَابِ مُشْتَرِكُونَ {33}
නියත වශයෙන්ම අපි වැරදිකරුවන් සමග කටයුතු කරන්නේ එලෙසය.	إِنَّا كَذَٰلِكَ نَفْعَلُ بِالْمُجْرِمِينَ {34}

إِنَّهُمْ كَانُوا إِذَا قِيلَ لَهُمْ لَا إِلَٰهَ إِلَّا اللَّهُ يَسْتَكْبِرُونَ {35}

“අල්ලාහ් හැර වෙනත් දෙවිදෙකු නැතැයි” ඔවුනට පැවසූ විට, නියත වශයෙන්ම ඔවුහු උඩඟුකම් පාමින් සිටියහ.

وَيَقُولُونَ أَئِنَّا لَتَارِكُو آلِهَتِنَا لِشَاعِرٍ مَّجْنُونٍ {36}

තවද “උමතු වූ කවියෙකු වෙනුවෙන් අපි අපගේ දෙවිවරුන් අතහැර දමන්නෝ වෙමුදැ”යි ඔවුහු පවසා සිටිති.

بَلْ جَاءَ بِالْحَقِّ وَصَدَّقَ الْمُرْسَلِينَ {37}

නමුත් ඔහු සත්‍යය සමග පැමිණියේය. තවද ඔහු (පෙර සිටි) දහම් දූතයින් සත්‍යය කළේය.

إِنَّكُمْ لَذَائِقُو الْعَذَابِ الْأَلِيمِ {38}

නියත වශයෙන්ම (අපිශ්ට ජනයා වන) නුඹලා එම වේදනීය දඬුවම රස විඳින්නෝමය.

وَمَا تُجْزَوْنَ إِلَّا مَا كُنْتُمْ تَعْمَلُونَ {39}

නුඹලා සිදු කරමින් සිටි දැට මිස නුඹලාට ප්‍රතිඵල දෙනු නොලබනු ඇත.

40-51 ස්වර්ගවාසීහු හා ඔවුනට හිමි සැපත.

إِلَّا عِبَادَ اللَّهِ الْمُخْلَصِينَ {40}

නමුත් අල්ලාහ්ගේ අවංක වූ ගැත්තන් හැර.

أُولَٰئِكَ لَهُمْ رِزْقٌ مَعْلُومٌ {41}

තමන්ට නියම කරන ලද පෝෂණය ඇත්තෝ ඔවුහුමය.

فَوَاكِهُ ۖ وَهُمْ مُكْرَمُونَ {42}

පලතුරු ද ඇත. තවද ඔවුහු ගරු කරනු ලබන්නෝය.

فِي جَنَّاتِ النَّعِيمِ {43}

සැප පහසුකම් සහිත උයන්හි

عَلَىٰ سُرُرٍ مُتَقَابِلِينَ {44}

යහන් මත එකිනෙකාට මුහුණ ලා සිටිති.

يُطَافُ عَلَيْهِمْ بِكَأْسٍ مِنْ مَعِينٍ {45}

උල්පතින් වූ කුසලාන (ජලබඳුන්) ඔවුන් වටා යවනු ලැබේ.

بَيْضَاءَ لَذَّةٍ لِلشَّارِبِينَ {46}

එය සුදු පැහැතිය. පානය කරන්නන් හට ප්‍රණීතය.

لَا فِيهَا غَوْلٌ وَلَا هُمْ عَنْهَا يُنْزَفُونَ {47}

එහි (සිහිවිකල් වන ආකාරයේ) උවදුරක් නොමැත. තවද ඔවුහු එයින් මත් බවට පත් කරනු ලබන්නෝ නොවෙති.

وَعِنْدَهُمْ قَاصِرَاتُ الطَّرْفِ عِينٌ {48}

තවද දමිත බැල්මෙන් යුත් ලලනාවෝ ඔවුන් අබියස වෙති.

كَأَنَّهُنَّ بَيْضٌ مَكْنُونٌ {49}

නියත වශයෙන්ම ඔවුන් සඟවා තබනු ලැබූ බිත්තර මෙනි.

فَأَقْبَلَ بَعْضُهُمْ عَلَىٰ بَعْضٍ يَتَسَاءَلُونَ {50}

ඔවුන් එකිනෙකා (මෙලොව කටයුතු කළ ආකාරය) විමසා ගනිමින් ඔවුන්ගෙන් ඇතැමෙක් ඇතැමෙකු ඉදිරියට එනු ඇත.

قَالَ قَائِلٌ مِنْهُمْ إِنِّي كَانَ لِي قَرِينٌ {51}

නියත වශයෙන්ම මට සමීප මිතුරෙකු සිටියේ යැයි ඔවුන් අතුරින් ප්‍රකාශකයකු පවසනු ඇත.

52-55 මියැදුණු පසු නැවත නැගිටුවීම පිළිබඳ අකමැත්ත ප්‍රකාශ කිරීම.

يَقُولُ أَإِنَّكَ لَمِنَ الْمُصَدِّقِينَ {52}

නියත වශයෙන්ම ඔබ සත්‍ය කරන්නන් අතුරින් දැ?යි ඔහු පවසයි.

أَإِذَا مِتْنَا وَكُنَّا تُرَابًا وَعِظَامًا أَإِنَّا لَمَدِينُونَ {53}

අප මිය ගොස් පස් හා අස්ථි බවට පත් වූ විට නියත වශයෙන්ම අප විමසනු ලබන්නේ දැ?(යි ද ඔහු විමසයි.)

قَالَ هَلْ أَنْتُمْ مُطَّلِعُونَ {54}

නුඹලා එබී බැලිය යුත්තෝ දැයි ඔහු විමසයි.

فَاطَّلَعَ فَرَآهُ فِي سَوَاءِ الْجَحِيمِ {55}

එවිට ඔහු එබී බලයි. එවිට ඔහු නිරය මැද සිටිනු ඔහු දකිනු ඇත.

56-61 ස්වර්ගයේ සිටින මුඃමින්වරයා, දේව ප්‍රතික්ෂේපයෙන් සහ නිරයෙන් තමන් ආරක්ෂා කර දුන් තම පරමාධිපතිට තුති පුද කිරීම.

قَالَ تَاللَّهِ إِنْ كِدْتَ لَتُرْدِينِ {56}

අල්ලාහ් මත දිවුරා පවසමි. ඔබ මා විනාශ කරන්නට තැත් කළෙහිය.

وَلَوْلَا نِعْمَةُ رَبِّي لَكُنْتُ مِنَ الْمُحْضَرِينَ {57}

මාගේ පරමාධිපතිගේ ආශිර්වාදය නොවී නම් මම (විනිශ්චය සඳහා) සම්මුඛ කරනු ලබන්නන් අතුරින් වෙමි.

أَفَمَا نَحْنُ بِمَيِّتِينَ {58}

එසේ නම් අප මිය යන්නන් ලෙස නොවන්නෙමු ද?

إِلَّا مَوْتَتَنَا الْأُولَىٰ وَمَا نَحْنُ بِمُعَذَّبِينَ {59}

අපගේ මුල් මරණය මිස. තවද අපි දඬුවම් කරනු ලබන්නන් නොවෙමු.

إِنَّ هَٰذَا لَهُوَ الْفَوْزُ الْعَظِيمُ {60}

නියත වශයෙන්ම මෙයමය අතිමහත් ජයග්‍රහණය.

لِمِثْلِ هَٰذَا فَلْيَعْمَلِ الْعَامِلُونَ {61}

මෙවන් දැයට ක්‍රියා කරන්නෝ ක්‍රියා කරත්වා!

62-74 නිරයේ වෙසෙන අපරාධකරුවන් සඳහා පිරිනමන zසක්කූම් නම් කටු ගස.

أَذَٰلِكَ خَيْرٌ نُزُلًا أَمْ شَجَرَةُ الزَّقُّومِ {62}

සංග්‍රහයෙන් ශ්‍රේෂ්ඨ වනුයේ එය ද එසේ නැතහොත් zසක්කූම් (නම් කටු) ගසද?

إِنَّا جَعَلْنَاهَا فِتْنَةً لِلظَّالِمِينَ {63}

නියත වශයෙන්ම අපි එය අපරාධකරුවන්ට පරීක්ෂණයක් බවට පත් කළෙමු.

إِنَّهَا شَجَرَةٌ تَخْرُجُ فِي أَصْلِ الْجَحِيمِ {64}

නියත වශයෙන්ම එය නිරය පතුලෙහි මතු වෙන ගසකි.

طَلْعُهَا كَأَنَّهُ رُءُوسُ الشَّيَاطِينِ {65}

එහි පොහොට්ටු ෂෙයිතානුන්ගේ හිස් මෙනි.

فَإِنَّهُمْ لَآكِلُونَ مِنْهَا فَمَالِئُونَ مِنْهَا الْبُطُونَ {66}

එවිට ඔවුහු එයින් අනුභව කරන්නෝ වෙති. එවිට ඔවුහු එයින් කුසවල් පුරවාගන්නෝ වෙති.

ثُمَّ إِنَّ لَهُمْ عَلَيْهَا لَشَوْبًا مِنْ حَمِيمٍ {67}

පසු ව නියත වශයෙන්ම ඔවුනට එහි ලෝ දියෙන් යුත් පානයක් ඇත.

ثُمَّ إِنَّ مَرْجِعَهُمْ لَإِلَى الْجَحِيمِ {68}

පසු ව නියත වශයෙන්ම ඔවුන් යොමු කරනු ලබන ස්ථානය ඇත්තේ නිරය වෙතය.

إِنَّهُمْ أَلْفَوْا آبَاءَهُمْ ضَالِّينَ {69}

නියත වශයෙන්ම ඔවුහු ඔවුන්ගේ මුතුන් මිත්තන් නොමග ගියවුන් බව දුටුවෝය.

فَهُمْ عَلَىٰ آثَارِهِمْ يُهْرَعُونَ {70}

එහෙත් ඔවුහු ඔවුන්ගේ සලකුණු මත යන්නට යුහුසුළු වෙති.

وَلَقَدْ ضَلَّ قَبْلَهُمْ أَكْثَرُ الْأَوَّلِينَ {71}

ඔවුනට පෙර සිටි මුතුන් මිත්තන් බහුතරයක් දෙනා සැබැවින්ම නොමග ගියෝය.

وَلَقَدْ أَرْسَلْنَا فِيهِمْ مُنْذِرِينَ {72}	තවද සැබැවින්ම අපි ඔවුන් අතරට අවවාද කරන්නන් එව්වෙමු.
فَانْظُرْ كَيْفَ كَانَ عَاقِبَةُ الْمُنْذَرِينَ {73} إِلَّا عِبَادَ اللَّهِ الْمُخْلَصِينَ {74}	අල්ලාහ්ගේ අවංක ගැත්තන්ට හැර අවවාද කරනු ලැබූ (නමුත් ඒවා ඉවත දැමූ)වන්ගේ අවසානය කෙසේ වූයේ දැයි මැනවින් බලනු.

75-82 නූහ් (අලය්හිස් සලාම්) තුමාගේ කතා වස්තුව.

وَلَقَدْ نَادَانَا نُوحٌ فَلَنِعْمَ الْمُجِيبُونَ {75}	තවද සැබැවින්ම නූහ් අප ඇමතුවේය. එවිට (අපි) යහපත් ප්‍රතිචාර දක්වන්නෝ වූයෙමු.
وَنَجَّيْنَاهُ وَأَهْلَهُ مِنَ الْكَرْبِ الْعَظِيمِ {76}	තවද අපි ඔහු හා ඔහුගේ නිවැසියන් මහා විපතින් මුදවා ගත්තෙමු.
وَجَعَلْنَا ذُرِّيَّتَهُ هُمُ الْبَاقِينَ {77}	තවද අපි ඔහුගේ පරපුර ඉතිරිවූවන් බවට පත් කළෙමු.
وَتَرَكْنَا عَلَيْهِ فِي الْآخِرِينَ {78}	තවද පසු පරපුර අතර ඔහු (පැසසුමට ලක්වන්නට) අපි අතහැර දැමුවෙමු.
سَلَامٌ عَلَىٰ نُوحٍ فِي الْعَالَمِينَ {79}	ලෝවැසියන් අතර නූහ් ට ශාන්තිය අත්වේවා!
إِنَّا كَذَٰلِكَ نَجْزِي الْمُحْسِنِينَ {80}	නියත වශයෙන්ම අපි දැහැමියන්ට ප්‍රතිඵල පිරිනමනුයේ එලෙසය.
إِنَّهُ مِنْ عِبَادِنَا الْمُؤْمِنِينَ {81}	නියත වශයෙන්ම (නූහ් වන) ඔහු දෙවියන් විශ්වාස කරන අපගේ ගැත්තන් අතුරින් විය.

ثُمَّ أَغْرَقْنَا الْآخَرِينَ {82}	පසු ව අපි සෙස්සන් (දියේ) ගිල්වූයෙමු.

83-98 ඉබ්‍රාහීම් (අලයිහිස් සලාම්) තුමා තම ප්‍රජාව සමඟ.

وَإِنَّ مِنْ شِيعَتِهِ لَإِبْرَاهِيمَ {83}	තවද නියත වශයෙන්ම ඔහුගේ පිළිවෙතින් වූ කෙනෙකි ඉබ්‍රාහීම්.
إِذْ جَاءَ رَبَّهُ بِقَلْبٍ سَلِيمٍ {84}	සන්සුන් හදවතකින් ඔහු ඔහුගේ පරමාධිපති වෙත පැමිණි අවස්ථාව සිහිපත් කරනු.
إِذْ قَالَ لِأَبِيهِ وَقَوْمِهِ مَاذَا تَعْبُدُونَ {85}	'නුඹලා කුමක් නමදින්නෙහුදැ?'යි ඔහු තම පියා හා තම ජනයාට පැවසූ අවස්ථාව සිහිපත් කරනු.
أَئِفْكًا آلِهَةً دُونَ اللَّهِ تُرِيدُونَ {86}	"අල්ලාහ් හැර ව්‍යාජ දෙවිවරුන් නුඹලා අපේක්ෂා කරන්නෙහු ද?"
فَمَا ظَنُّكُمْ بِرَبِّ الْعَالَمِينَ {87}	"එසේ නම් ලෝවැසියන්ගේ පරමාධිපති පිළිබඳ නුඹලාගේ අදහස කුමක් ද?"
فَنَظَرَ نَظْرَةً فِي النُّجُومِ {88}	එවිට ඔහු තාරකා අතර මනා බැල්මකින් අධීක්ෂණයෙන් බැලුවේය.
فَقَالَ إِنِّي سَقِيمٌ {89}	එවිට (ඔවුන්ගේ උත්සවයට සහභාගි වීම වළක්වනු පිණිස) 'නියත වශයෙන්ම මම රෝගියෙකි' යැයි ඔහු පැවසුවේය.
فَتَوَلَّوْا عَنْهُ مُدْبِرِينَ {90}	එවිට ඔවුහු පිටුපාන්නන් ලෙසින් ඔහු වෙතින් හැරී ගියෝය.
فَرَاغَ إِلَىٰ آلِهَتِهِمْ فَقَالَ أَلَا تَأْكُلُونَ {91}	පසු ව ඔහු ඔවුන්ගේ දෙවිවරුන් (පිළිම) වෙත හීන් සීරුවේ නැඹුරු වී "නුඹලා අනුභව

නොකරන්නෙහුදැ'' යි විමසා සිටියේය.

مَا لَكُمْ لَا تَنْطِقُونَ {92}

''නුඹලා කතා නොකර සිටීමට නුඹලාට කුමක් වීද? ''

فَرَاغَ عَلَيْهِمْ ضَرْبًا بِالْيَمِينِ {93}

පසු ව ඔහු (ඉබ්‍රාහීම්) ඔවුන් (පිළිම) වෙත හීන්සීරුවේ ගොස් තම දකුණතින් පහරක් දුන්නේය.

فَأَقْبَلُوا إِلَيْهِ يَزِفُّونَ {94}

ඔවුහු වේගයෙන් ගමන් ගනිමින් ඔහු ඉදිරියට පැමිණියෝය.

قَالَ أَتَعْبُدُونَ مَا تَنْحِتُونَ {95}

''නුඹලා කැටයම් කළ දෑට නුඹලා ගැතිකම් කරන්නෙහුදැ?''යි ඔහු විමසුවේය.

وَاللَّهُ خَلَقَكُمْ وَمَا تَعْمَلُونَ {96}

''තවද අල්ලාහ් නුඹලා සහ නුඹලා ඉදි කරන දෑ මැව්වේය.''

قَالُوا ابْنُوا لَهُ بُنْيَانًا فَأَلْقُوهُ فِي الْجَحِيمِ {97}

''ඔහු වෙනුවෙන් ගොඩනැගිල්ලක් තනා පසුව ඔහුව ගින්නෙහි හෙළනු යැ''යි ඔවුහු පැවසූහ.

فَأَرَادُوا بِهِ كَيْدًا فَجَعَلْنَاهُمُ الْأَسْفَلِينَ {98}

එවිට ඔවුහු ඔහුට (ඉබ්‍රාහීම් ට) කුමන්ත්‍රණයක් කිරීමට අදහස් කළෝය. එහෙයින් අපි ඔවුන් පහත්වූවන් බවට පත් කළෙමු.

99,100. ඉබ්‍රාහීම් නබිට සුභාරංචියක්

وَقَالَ إِنِّي ذَاهِبٌ إِلَىٰ رَبِّي سَيَهْدِينِ {99}

''නියත වශයෙන්ම මම මාගේ පරමාධිපති වෙත යන්නෙකු වෙමි. ඔහු මට මග පෙන්වනු ඇතැයි'' (ගින්නෙන් මිදුනු) ඔහු පැවසුවේය.

رَبِّ هَبْ لِي مِنَ الصَّالِحِينَ {100}	මාගේ පරමාධිපතියාණනි! මා හට දැහැමියන් අතුරින් කෙනෙකු පිරිනමනු. (යැයි පැවසුවේය.)

101-113. සිහිනය සැබෑ කළ නබි ඉස්මාඊල් (අලයිහිස් සලාම්) තුමා

فَبَشَّرْنَاهُ بِغُلَامٍ حَلِيمٍ {101}	එවිට ඉවසිලිවන්ත දරුවකු පිළිබඳ ව අපි ඔහුට ශුභාරංචි දුන්නෙමු.
فَلَمَّا بَلَغَ مَعَهُ السَّعْيَ قَالَ يَا بُنَيَّ إِنِّي أَرَىٰ فِي الْمَنَامِ أَنِّي أَذْبَحُكَ فَانْظُرْ مَاذَا تَرَىٰ ۚ قَالَ يَا أَبَتِ افْعَلْ مَا تُؤْمَرُ ۖ سَتَجِدُنِي إِنْ شَاءَ اللَّهُ مِنَ الصَّابِرِينَ {102}	ඔහු සමග ඇවිද යන වියට ඔහු ළඟා වූ කල්හි, "අහෝ මාගේ පුතණුවනි! නියත වශයෙන්ම මම ඔබගේ ගෙල සිඳ දමන්නාක් මෙන් සිහිනයක් දුටුවෙමි. එහෙයින් (ඒ ගැන) ඔබ අදහස් කරනුයේ කුමක්දැයි බලනු." යැයි කීහ. "අහෝ මාගේ පියාණනි! ඔබට අණ කරනු ලබන දෑ ඔබ සිදු කරනු. අල්ලාහ්ගේ අභිමතය පරිදි ඔබ මා ඉවසිලිවන්තයින් අතුරින් දැක ගනු ඇතැයි" ඔහු (පුතු) පැවසීය.
فَلَمَّا أَسْلَمَا وَتَلَّهُ لِلْجَبِينِ {103}	පසු ව ඔවුන් දෙදෙනා (අල්ලාහ්ගේ අභිමතයට) එකඟ වූ කල්හි (ඉබ්‍රාහීම්) ඔහු (ඉස්මායිල් වන) ඔහු ව මුණින් අතට පෙරළා දැමීය.
وَنَادَيْنَاهُ أَنْ يَا إِبْرَاهِيمُ {104}	තවද 'අහෝ ඉබ්‍රාහීම්!' යැයි අපි ඔහු ඇමතුවෙමු.
قَدْ صَدَّقْتَ الرُّؤْيَا ۚ إِنَّا كَذَٰلِكَ نَجْزِي الْمُحْسِنِينَ {105}	"සැබැවින්ම ඔබ සිහිනය සැබෑ කළෙහිය." නියත වශයෙන්ම අපි එලෙසය දැහැමියන්ට ප්‍රතිඵල පිරිනමනුයේ.

إِنَّ هَٰذَا لَهُوَ الْبَلَاءُ الْمُبِينُ {106}	නියත වශයෙන්ම පැහැදිලි පරීක්ෂාව මෙයමය.
وَفَدَيْنَاهُ بِذِبْحٍ عَظِيمٍ {107}	මහත් වූ (සත්ව) කැපයක් අපි ඔහුට ඇප වශයෙන් පිරිනැමුවෙමු.
وَتَرَكْنَا عَلَيْهِ فِي الْآخِرِينَ {108}	තවද සෙස්සන් අතර ඔහු (පැසසුමට ලක්වන්නට) අපි අතහැර දැමුවෙමු.
سَلَامٌ عَلَىٰ إِبْرَاهِيمَ {109}	"ඉබ්‍රාහීම් වෙත ශාන්තිය අත්වේවා!"
كَذَٰلِكَ نَجْزِي الْمُحْسِنِينَ {110}	අපි දැහැමියන්ට ප්‍රතිඵල පිරිනමනුයේ එලෙසය.
إِنَّهُ مِنْ عِبَادِنَا الْمُؤْمِنِينَ {111}	නියත වශයෙන්ම ඔහු දෙවියන් විශ්වාස කරන අපගේ ගැත්තන් අතුරින් විය.
وَبَشَّرْنَاهُ بِإِسْحَاقَ نَبِيًّا مِنَ الصَّالِحِينَ {112}	තවද අපි දැහැමියන් අතුරින් නබිවරයකු වශයෙන් ඉස්හාක් පිළිබඳව ඔහුට ශුභාරංචි දැන්වූයෙමු.
وَبَارَكْنَا عَلَيْهِ وَعَلَىٰ إِسْحَاقَ ۚ وَمِنْ ذُرِّيَّتِهِمَا مُحْسِنٌ وَظَالِمٌ لِنَفْسِهِ مُبِينٌ {113}	තවද අපි ඔහු වෙත හා ඉස්හාක් වෙත අභිවෘද්ධිය ලබා දුනිමු. තවද ඔවුන් දෙදෙනාගේ පරපුරින් දැහැමි අය ද ප්‍රකට ලෙස තමන්ටම අපරාධ කර ගන්නා අය ද විය.

114-122 මූසා හා හාරූන් (අලය්හිමස් සලාම්) යන නබිවරුන්ගේ කතා වස්තුව.

وَلَقَدْ مَنَنَّا عَلَىٰ مُوسَىٰ وَهَارُونَ {114}	තවද සැබැවින්ම අපි මූසා හා හාරූන් වෙත උපකාර කළෙමු.
وَنَجَّيْنَاهُمَا وَقَوْمَهُمَا مِنَ الْكَرْبِ الْعَظِيمِ {115}	තවද අපි ඔවුන් දෙදෙනා හා ඔවුන් දෙදෙනාගේ පිරිස මහත් වූ ව්‍යසනයෙන් මුදවා ගත්තෙමු.
وَنَصَرْنَاهُمْ فَكَانُوا هُمُ الْغَالِبِينَ {116}	තවද අපි ඔවුනට උදව් කළෙමු. එහෙයින් ඔවුහු අබිබවා යන්නන් වූහ.
وَآتَيْنَاهُمَا الْكِتَابَ الْمُسْتَبِينَ {117}	තවද අපි ඔවුන් දෙදෙනාට පැහැදිලි දේව ග්‍රන්ථය පිරිනැමුවෙමු.
وَهَدَيْنَاهُمَا الصِّرَاطَ الْمُسْتَقِيمَ {118}	තවද අපි ඍජු මාර්ගය වෙත ඔවුන් දෙදෙනාට මග පෙන්වූයෙමු.
وَتَرَكْنَا عَلَيْهِمَا فِي الْآخِرِينَ {119}	තවද සෙස්සන් අතර ඔවුන් දෙදෙනා වෙත (පැසසුමට ලක්වන්නට) අපි අතහැර දැමුවෙමු.
سَلَامٌ عَلَىٰ مُوسَىٰ وَهَارُونَ {120}	තවද මූසා හා හාරූන් වෙත ශාන්තිය අත්වේවා!
إِنَّا كَذَٰلِكَ نَجْزِي الْمُحْسِنِينَ {121}	නියත වශයෙන්ම අපි දැහැමියන්ට ත්‍යාග පිරිනමනුයේ එලෙසය.
إِنَّهُمَا مِنْ عِبَادِنَا الْمُؤْمِنِينَ {122}	නියත වශයෙන්ම ඔවුන් දෙදෙනා දෙවියන් විශ්වාස කරන අපගේ ගැත්තන් අතුරින් වෙති.

123-129 ඉල්යාස් (අලෛහිස් සලාම්) තුමා තම ජනයා සමඟ.

وَإِنَّ إِلْيَاسَ لَمِنَ الْمُرْسَلِينَ {123}	තවද නියත වශයෙන්ම ඉල්යාස් දහම් දූතයින් අතුරිනි.
إِذْ قَالَ لِقَوْمِهِ أَلَا تَتَّقُونَ {124}	"නුඹලා බැතිමත් නොවන්නෙහු දැ"යි ඔහු තම ජනයාට පැවසූ අවස්ථාව සිහියට නගනු.
أَتَدْعُونَ بَعْلًا وَتَذَرُونَ أَحْسَنَ الْخَالِقِينَ {125} اللَّهَ رَبَّكُمْ وَرَبَّ آبَائِكُمُ الْأَوَّلِينَ {126}	"මැවුම්කරුවන්ගෙන් වඩාත් විශිෂ්ටතයා වූ ද නුඹලාගේ පරමාධිපති වූ ද නුඹලාගේ මුල් මුතුන්මිත්තන්ගේ පරමාධිපති වූ ද අල්ලාහ් අතහැර දමා නුඹලා (බඅල් නම්) වෙනත් දෙවියකුට ඇරයුම් කරන්නෙහු ද?
فَكَذَّبُوهُ فَإِنَّهُمْ لَمُحْضَرُونَ {127}	නමුත් ඔවුහු ඔහු බොරු කළෝය. එහෙයින් ඔවුහු (විනිශ්චය වෙත) ඉදිරිපත් කරනු ලබන්නෝ වූහ.
إِلَّا عِبَادَ اللَّهِ الْمُخْلَصِينَ {128}	නමුත් අල්ලාහ්ගේ අවංක ගැත්තන් හැර.
وَتَرَكْنَا عَلَيْهِ فِي الْآخِرِينَ {129}	තවද සෙස්සන් අතර ඔහු (පැසසුමට ලක්වන්නට) අපි අතහැර දැමුවෙමු.

130-132 ඉල්යාස් (අලය්හිස් සලාම්) තුමා

سَلَامٌ عَلَىٰ إِلْ يَاسِينَ {130}	ඉල්යාසීන් වෙත ශාන්තිය අත්වේවා!
إِنَّا كَذَٰلِكَ نَجْزِي الْمُحْسِنِينَ {131}	නියත වශයෙන්ම අපි දැහැමියන්ට ප්‍රතිඵල පිරිනමනුයේ එලෙසය.

නියත වශයෙන්ම ඔහු දෙවියන් විශ්වාස කරන අපගේ ගැත්තන් අතුරින් වෙයි.	إِنَّهُ مِنْ عِبَادِنَا الْمُؤْمِنِينَ {132}

133-138 ලූත් (අලය්හිස් සලාම්) තුමා තම ජනයා සමග.

තවද නියත වශයෙන්ම ලූත් දහම් දූතයින් අතුරිනි.	وَإِنَّ لُوطًا لَمِنَ الْمُرْسَلِينَ {133}
ඉතිරි වූවන් අතර වූ මැහැල්ලියක් හැර ඔහු හා ඔහුගේ සෙසු සියලු නිවැසියන් මුදවා ගත් අවස්ථාව සිහිපත් කරනු.	إِذْ نَجَّيْنَاهُ وَأَهْلَهُ أَجْمَعِينَ {134} إِلَّا عَجُوزًا فِي الْغَابِرِينَ {135}
පසු ව අපි සෙස්සන් සහමුලින්ම විනාශ කළෙමු.	ثُمَّ دَمَّرْنَا الْآخَرِينَ {136}
තවද නියත වශයෙන්ම නුඹලා උදෑසන ද රාත්‍රියෙහි ද ඔවුන්(ගේ විනාශ කරනු ලැබූ වාසස්ථාන) පසුකර ගමන් ගන්නෙහුය. එහෙයින් නුඹලා වටහා නොගන්නෙහු ද?	وَإِنَّكُمْ لَتَمُرُّونَ عَلَيْهِمْ مُصْبِحِينَ {137} وَبِاللَّيْلِ ۗ أَفَلَا تَعْقِلُونَ {138}

139-148 යූනුස් (අලය්හිස් සලාම්) තුමා තම ජනයා සමග.

තවද නියත වශයෙන්ම යූනුස් දහම් දූතයින් අතුරිනි.	وَإِنَّ يُونُسَ لَمِنَ الْمُرْسَلِينَ {139}
පටවන ලද නැව වෙත ඔහු පලා ගිය අවස්ථාව සිහියට නගනු.	إِذْ أَبَقَ إِلَى الْفُلْكِ الْمَشْحُونِ {140}

فَسَاهَمَ فَكَانَ مِنَ الْمُدْحَضِينَ {141}

එවිට කුසපත් ඇද්දේය. එවිට ඔහු කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලැබූවන් අතුරින් විය.

فَالْتَقَمَهُ الْحُوتُ وَهُوَ مُلِيمٌ {142}

පසු ව ඔහු දොස් නගනු ලැබූ තත්ත්වයේ මත්සයා ඔහු ගිල දැමීය.

فَلَوْلَا أَنَّهُ كَانَ مِنَ الْمُسَبِّحِينَ {143} لَلَبِثَ فِي بَطْنِهِ إِلَىٰ يَوْمِ يُبْعَثُونَ {144}

නියත වශයෙන්ම ඔහු සුවිශුද්ධ කරන්නන් අතුරින් කෙනෙකු නොවී නම් ඔහු මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනය දක්වා උගේ කුස තුළ රැඳෙන්නට තිබුණි.

فَنَبَذْنَاهُ بِالْعَرَاءِ وَهُوَ سَقِيمٌ {145}

එවිට ඔහු රෝගී ව සිටිය දී අපි ඔහු පාළු වෙරළකට හෙළුවෙමු.

وَأَنْبَتْنَا عَلَيْهِ شَجَرَةً مِنْ يَقْطِينٍ {146}

තවද අපි ඒ මත වැල් වලින් යුත් (ලබු වැනි) ගසක් හට ගැන්වූයෙමු.

وَأَرْسَلْنَاهُ إِلَىٰ مِائَةِ أَلْفٍ أَوْ يَزِيدُونَ {147}

තවද අපි ඔහු සිය දහසක් දෙනා වෙත හෝ (ඊට වඩා) අධික වූ අය වෙත දහම් දූතයකු ලෙස එව්වෙමු

فَآمَنُوا فَمَتَّعْنَاهُمْ إِلَىٰ حِينٍ {148}

එවිට ඔවුහු විශ්වාස කළෝය. එහෙයින් අපි ඔවුනට ටික කලකට භුක්ති විඳින්නට සැලැස්වූයෙමු.

149-182 දේව ආදේශකයින් තමන්ගේ ප්‍රතිපත්තීන් පිළිබඳ තර්කයක. එමෙන්ම ඔවුනට කළ අවවාදය.

فَاسْتَفْتِهِمْ أَلِرَبِّكَ الْبَنَاتُ وَلَهُمُ الْبَنُونَ {149}

ඔබේ පරමාධිපතිට ගැහැනු දරුවන් සහ ඔවුනට පිරිමි දරුවන් දැයි ඔබ ඔවුන්ගෙන් කරුණු විමසනු.

أَمْ خَلَقْنَا الْمَلَائِكَةَ إِنَاثًا وَهُمْ شَاهِدُونَ {150}	එසේ නැතහොත් (අප ඉදිරියේ) ඔවුන් සාක්ෂිකරුවන් ලෙස සිටිය දී අපි මලක්වරුන් කාන්තාවන් ලෙස මවා ඇත්තෙමු ද?
أَلَا إِنَّهُمْ مِنْ إِفْكِهِمْ لَيَقُولُونَ {151} وَلَدَ اللَّهُ وَإِنَّهُمْ لَكَاذِبُونَ {152}	දැන ගනු. නියත වශයෙන්ම ඔවුන් බොරු ගොතමින් අල්ලාහ් ජාතක කළේ යැයි ඔවුන් පවසනු ඇත. තවද නියත වශයෙන්ම ඔවුහු මුසාවාදීහුය.
أَصْطَفَى الْبَنَاتِ عَلَى الْبَنِينَ {153}	ඔහු පුතුන්ට වඩා දූවරුන් තෝරා ගත්තේද?
مَا لَكُمْ كَيْفَ تَحْكُمُونَ {154}	නුඹලාට කුමක් වී ද? නුඹලා තීන්දු කරනුයේ කෙසේ ද?
أَفَلَا تَذَكَّرُونَ {155}	නුඹලා මෙනෙහි නොකරන්නෙහු ද?
أَمْ لَكُمْ سُلْطَانٌ مُبِينٌ {156}	නැතහොත් (මේ පිළිබඳ) නුඹලාට පැහැදිලි බලයක් තිබේ ද?
فَأْتُوا بِكِتَابِكُمْ إِنْ كُنْتُمْ صَادِقِينَ {157}	එසේ නුඹලා සත්‍යවාදීන් ලෙස සිටියෙහු නම්, නුඹලා නුඹලාගේ (බල සහිත) පුස්තකය ගෙන එනු.
وَجَعَلُوا بَيْنَهُ وَبَيْنَ الْجِنَّةِ نَسَبًا ۚ وَلَقَدْ عَلِمَتِ الْجِنَّةُ إِنَّهُمْ لَمُحْضَرُونَ {158}	තවද ඔහු අතර හා ජින්නුන් අතර ඔවුහු නෑදෑකමක් ඇති කළෝය. තවද නියත වශයෙන්ම තමන් සම්මුඛ කරනු ලබන්නෝම යැයි ජින්නුන් සැබැවින්ම දැනගත්තෝය.

سُبْحَانَ اللَّهِ عَمَّا
يَصِفُونَ {159}

ඔවුන් ආරෝපණය කරන දැයින් අල්ලාහ් සුවිශුද්ධය.

إِلَّا عِبَادَ اللَّهِ
الْمُخْلَصِينَ {160}

නමුත් අල්ලාහ්ගේ අවංක ගැත්තන් හැර.

فَإِنَّكُمْ وَمَا تَعْبُدُونَ {161}
مَا أَنْتُمْ عَلَيْهِ بِفَاتِنِينَ {162}
إِلَّا مَنْ هُوَ صَالِ
الْجَحِيمِ {163}

එහෙයින් සැබැවින්ම නුඹලා හා නුඹලා නමදින දෑ, නිරා ගින්නට පිවිස◌ීමට, කළින් නියම කරනු ලැබුවන් හැර වෙන කිසිවකු ඔහුට එරෙහිව නොමග හරින්නන් ලෙස නුඹලා නැත.

وَمَا مِنَّا إِلَّا لَهُ مَقَامٌ
مَعْلُومٌ {164} وَإِنَّا لَنَحْنُ
الصَّافُّونَ {165} وَإِنَّا لَنَحْنُ
الْمُسَبِّحُونَ {166}

නියම කරනු ලැබූ ස්ථානයක් තමන්ට හිමිව ඇත්තන් මිස අප අතුරින් (කිසිවෙක්) නැත. තවද නියත වශයෙන්ම අපමය පෙළගැසෙන්නෝ. තවද නියත වශයෙන්ම අපමය පිවිතුරු කරන්නෝ.

وَإِنْ كَانُوا لَيَقُولُونَ {167} لَوْ
أَنَّ عِنْدَنَا ذِكْرًا مِنَ
الْأَوَّلِينَ {168} لَكُنَّا عِبَادَ اللَّهِ
الْمُخْلَصِينَ {169}

මුල් අයගෙන් වූ මෙනෙහි කිරීමක් සැබැවින්ම අප වෙත තිබුණේ නම් සැබැවින්ම අපි අල්ලාහ්ගේ අවංක ගැත්තන් වන්නට තිබුණි යැයි ඔවුහු පවසමින් සිටියෝය.

فَكَفَرُوا بِهِ ۖ فَسَوْفَ
يَعْلَمُونَ {170}

නමුත් ඔවුහු එය (කුර්ආනය) ප්‍රතික්ෂේප කළෝය. එහෙයින් ඔවුහු මතු දැන ගනු ඇත.

وَلَقَدْ سَبَقَتْ كَلِمَتُنَا لِعِبَادِنَا الْمُرْسَلِينَ {171}

දූතයන් වශයෙන් එවනු ලැබූ අපගේ ගැත්තන් හට අපගේ (ජයග්‍රහණයේ) වදන සැබැවින්ම පෙරටු විය.

إِنَّهُمْ لَهُمُ الْمَنْصُورُونَ {172}

නියත වශයෙන්ම ඔවුහුමය උදව් කරනු ලබන්නෝ.

وَإِنَّ جُنْدَنَا لَهُمُ الْغَالِبُونَ {173}

තවද නියත වශයෙන්ම අපගේ සේනාව වන ඔවුහුමය (අබිබවා යමින්) ජය ලබන්නෝ.

فَتَوَلَّ عَنْهُمْ حَتَّىٰ حِينٍ {174}

එහෙයින් ඔබ මද කලක් දක්වා ඔවුන්ගෙන් ඉවත් ව සිටිනු.

وَأَبْصِرْهُمْ فَسَوْفَ يُبْصِرُونَ {175}

තවද ඔවුන් ගැන ඔබ බලා සිටිනු. එවිට ඔවුන් (ඔවුන්ගේ දඬුවම) මතු දකිනු ඇත.

أَفَبِعَذَابِنَا يَسْتَعْجِلُونَ {176}

එහෙයින් අපගේ දඬුවම ද ඔවුන් ඉක්මණින් පතනුයේ?

فَإِذَا نَزَلَ بِسَاحَتِهِمْ فَسَاءَ صَبَاحُ الْمُنْذَرِينَ {177}

ඔවුන්ගේ මිදුලට එය පහළ වූ විට, අවවාද කරනු ලැබූවන්ගේ උදෑසන නපුරු විය.

وَتَوَلَّ عَنْهُمْ حَتَّىٰ حِينٍ {178}

මද කලක් දක්වා ඔවුන්ගෙන් ඔබ ඉවත් ව සිටිනු.

وَأَبْصِرْ فَسَوْفَ يُبْصِرُونَ {179}

තවද ඔවුන් ගැන ඔබ බලා සිටිනු. එවිට ඔවුන්(ගේ දඬුවම) මතු දකිනු ඇත.

سُبْحَانَ رَبِّكَ رَبِّ الْعِزَّةِ عَمَّا يَصِفُونَ {180}

ගෞරවය හිමි ඔබේ පරමාධිපති ඔවුන් වර්ණනා කරන දැයින් සුවිශුද්ධය.

وَسَلَامٌ عَلَى الْمُرْسَلِينَ {181}

සියලුම දහම් දූතයින් වෙත (සලාම් හෙවත්) සාමය අත්වේවා!

وَالْحَمْدُ لِلَّهِ رَبِّ الْعَالَمِينَ {182}

ලෝකයන්හි පරමාධිපති වූ අල්ලාහ්ටම සියලු ප්‍රශංසා හිමිය.

IslamHouse.com